# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/25/2022 (PSC)

ඩබ්.පී.ප්‍රේමසිරි වේරවැල්ල,
**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.02.26**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක ඩබ්.පී.පී.වේරවැල්ල, පුද්ගලිකව පෙනී සිටී, වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එල්.එච්.පී.කෝෂලා මිය.

**-<u>නියෝගය</u>-**

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක **1998.07.15** දින පශු සම්පත් හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස (පරිපාලන සේවා නොවන) සේවයට එක්වී ඇත. (ඇමුණුම්.2) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ A/4/33/7 හා **1998.08.06** දිනැති ලිපිය අනුව ඒ බැව් සනාථ වේ. එසේම අභියාචක රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින්ම **2003.05.19** දින සිට සේවය ස්ථිර කර ඇත. (ඇමුණුම් 03) අභියාචක මෙම අමාත්‍යාංශයේ සහ ඊට පසුව වරින්වර නම් වෙනස්වීම් වලට යටත්ව අදාළ අමාත්‍යාංශයේ විවිධ තනතුරු දරා, වසර **28** සේවා කාලයකින් පසුව **2024.10.27** දින විශ්‍රාම ලබා ඇත. අභියාචක වසර **24**ක සේවා කාලයකට පසුව **2021** වසරේ අවස්ථාවේ පැවති SOR බඳවා ගැනීමේ පරිපාටියට අනුව පළමු ශ්‍රේණියට උසස් කරන ලෙසට ඉල්ලා ඇත. ඒ පිළිබඳව නිර්දේශ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගෙන් සහ අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දී ඇත. එසේ වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් **2022.01.11** දින ලිපියක් මඟින්, ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර

සංවර්ධන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. ඒ ලිපියට අනුව අදාළ ලේකම්වරයා විසින් 2022.02.03 දින අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයෙන් ( අභියාචකගේ සේවා ස්ථානයට) දන්වා ඇත. එම ලිපියේ තොරතුරු අනුව සෑහීමට පත් නොවූ අභියාචක, 2022.02.06 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කරමින්, දීර්ඝ විස්තරයක් සහිතව තමාගේ අභියාචනයක් කරමින්, අප සභාවෙන් ඉල්ලා සිටින්නේ, පළමු ශ්‍රේණියට උසස් වීම සඳහා තමාගේ පශ්චාත් උපාධිය පිළිගන්නා ලෙසයි. ඒ අනුව තමාට හිමි පළමු ශ්‍රේණියේ තනතුර ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙසය. අභියාචක තම කරුණු සනාථ කිරීම සඳහා අදාළ අභියාචනා ලිපියට අමතරව ඇමුණුම් රැසක් ඉදිරිපත් කර ඇති අතර, 2025.03.01 දින ලිඛිත සැළකිරීම් ද, 2025.08.25 දින වැඩිදුරටත් නිරීක්ෂණ, ඇමුණුම් සමඟ ඉදිරිපත් කර ඇත. ඊට අමතරව විවෘත අධිකරණයේ දී වාචික සාක්ෂි මඟින් ද තවදුරටත් කරුණු පැහැදිලි කරන ලදි. ඒ සියළු කරුණු වල සාරාංශයක් පහතින් සටහන් කරමු.

1. 1998.07.15 දින සහකාර අධ්‍යක්ෂ (පරිපාලන සේවයේ නොවන) තනතුර යටතේ රාජ්‍ය සේවයට එක්වී ඇත.
2. 2003.05.19 දින, 1998.07.15 දින සිට සේවය ස්ථිර කර ඇත.
3. 2003.04.27 දින E.B 1 සමත් වී ඇත.
4. 2017.07.01 දින E.B.II සමත් වී ඇත.
5. කිසිදු දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන නිසා බඳවා ගන්නා අවස්ථාවේදී SOR බඳවා ගැනීම් පරිපාටියක් තිබී නැත.
6. 2012.06.26 දින (S.L-1 – 2006) යටතේ SOR බඳවා ගැනීම් පරිපාටියක් සකසා අනුමත කර ඇත. (වසර 06කට පසුව)
7. එම SOR අනුව

   10 යටතේ උසස්වීම් ක්‍රමවේදය සඳහන් වේ.

III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය

10:1:1:1.

I. පත්වීම ස්ථිර කර තිබීම,

II. III ශ්‍රේණියේ වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලය වැටුප් වර්ධන 10 උපයා ගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

VI. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා තිබීම.

**10:2** II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

**10:2-1** සාමාන්‍ය කාර්ය සාධනය අනුව

**10.2.1.1** සපුරාලිය යුතු සුදුසුකම්

I. අදාළ ක්ෂේත්‍රයේ (ජනසංනිවේදන සහකාර අධ්‍යක්ෂ, මාධ්‍ය/සංවර්ධන සහකාර අධ්‍යක්ෂ) පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. නිලධර ගණයේ II ශ්‍රේණියේ වසර 07ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 07ක් උපයා ගෙන තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 07 තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 07ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

**14** සේවයේ යෙදී සිටින සේවකයින් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම් අංක 05 මඟින් දක්වේ.

ඉහත බඳවා ගැනීමේ පරිපාටිය අනුව,

- **2012.06.26** දින III ශ්‍රේණියට අන්තරග්‍රහණය කර ඇත.
- **2012.06.27** දින II ශ්‍රේණියට උසස්කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ PSC/APP/6/257/2012 හා **2014.12.12** දින ලිපිය අනුව,

**08.** III ශ්‍රේණියේ තනතුරට අන්තර්ග්‍රහණය කරන අවස්ථාව වන විටද නිලධාරියා සමාන තනතුරක සහකාර අධ්‍යක්ෂ වසර 14ක සේවා කාලයක් සපුරා ඇත.

09. දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියෙකු වී නම් පළමු ශ්‍රේණියේ තනතුරකට සුදුසුකම් සපුරා ඇත.

10. ඇමුණුම් 05 අනුව,

I අභියාචක 2006 වසරේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු ලෙසද,

II 2007.03.01 – 2009.05.31 දින දක්වා අධ්‍යක්ෂ (වැඩ බලන) තනතුරකද සේවය කර ඇත.

III 2010.09.01 - 2012.04.22 දක්වා අධ්‍යක්ෂ(සංවර්ධන) සහ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ ආවරණ) ලෙස රාජකාරී ඉටුකර ඇත.

11. එසේ වුවත් අභියාචක නැවත 2012 වසරේ සිට සහකාර අධ්‍යක්ෂ තනතුරට සහ, 2015 වසරේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත්කර ඇත. ඉන්පසුව විශ්‍රාම යනතෙක් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක සේවය කර ඇත.

12. අභියාචක කිසිදු දීප ව්‍යාප්ත සේවායකට අයත් නොවීම මත සහ බඳවා ගැනීමේ පරිපාටියක් නිසි අයුරින් නොතිබීම නිසාම අභියාචකට උසස්වීම් ලබා ගැනීමේ දී දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇති බව පැහැදිලිවේ.

13. නව බඳවා ගැනීම් පරිපාටිය 2012 අනුමත වූ පසුව I ශ්‍රේණියට උසස් කිරීමට එකී සුදුසුකම් මත පශ්චාත් උපාධියක්, සංවර්ධන විෂය යටතේ තිබිය යුතුය යන්න මුල් කරගෙන අභියාචක තවත් අසීරුතාවයකට මුහුණ දී ඇත.

14. අභියාචක විසින් දේශපාලන විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධියක් පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් 1995 වසරේ ලබාගෙන ඇත. ඇමුණුම 01 යටතේ එය ඉදිරිපත් කර සිටී.

15. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම අධිකාරයට ඉදිරිපත් කරන ලද 2022.07.19 දින ලිපියේ 6 ජේදය අනුව ඒ පිළිගැනීමට අපහසු බව දන්වා සිටී.

16. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය පී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න විසින්, 2022.11.09 දින ලිපිය මගින් මෙම පශ්චාත් උපාධියේ වලංගු භාවය හා අදාළත්වය පිළිබඳව පැහැදිලි කර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත.

17. එසේම 2025.07.11 දින අදාළ මහාචාර්යවරයා විසින් එහි අදාළත්වය සහ විෂය සන්දර්භය ඇතුළත් ලිපියක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කර ඇත.

18. අදාළ ලිපිය පාදක කර ගනිමින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් විසින් 2025.08.06 දින ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, සංවර්ධන විෂය ක්ෂේත්‍රය යටතේ අදාළ පශ්චාත් උපාධිය පිළිගත හැකි බවයි.

19. එසේ වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2026.01.12 දිනැති ලිපිය මඟින් මෙම අධිකාරයට දන්වා සිටින්නේ, 2024.07.31 දින දරණ එම අයගේ නිරීක්ෂණ අනුව මෙම උපාධිය පිළිගැනීමට අපහසු බවයි.

20. අභියාචක 2025.05.25 දින ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වල ඇමුණුම් 01 ලෙස සටහන් කර ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්ගේ, 2025.08.06 ලිපියේ,

" These courses are highly relevant to development and development management.

In this context his Master of Political Science Degree is closely aligned with the filed of Development Studies.

ඇමුණුම් 2 ලෙස සටහන් කර ඇති පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අබේරත්න මහතාගේ 2025.07.11 ලිපියේ,

"I would like to kindly request in your capacity as the chairmen of the University Grant Commission to recommend Master of Political Science Degree for institutions requiring master degree for their confirmation and promotion such As the Rural Development Trading, and Research Institute. Inland Revenue Department and the Sri Lanka Foreign Service' I observe leaving Political Science out of prescribed subject streams for confirmation and promotion as ironic. I kindly make this opportunity to request you to urgently and kindly attend the bourgeoning problem faced by political Science graduates."

ඇමුණුම් 03, ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, වෙත යවන ලද ආයතනයේ අධ්‍යක්ෂකතුමාගේ 2021.10.22 දිනැති ලිපියේ අංක I

අප ආයතනයේ විෂය පථය තුළට ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන පුහුණු පර්යේෂණ හා ප්‍රකාශන කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී මෙම නිලධාරියා තම පශ්චාත් උපාධිය තුල ලබා ඇති විෂය දැනුම හා අවබෝධය ඉතාමත් ප්‍රයෝජනවත් බව මාගේ නිරීක්ෂණයයි.

මෙම සියළු තත්ත්වයන් කෙරෙහි මොහුගේ පශ්චාත් උපාධි දැනුම හා අවබෝධයත් ඒ තුළ ගොඩනැගී ඇති කුසලතාවයත් හේතුවී ඇති බව මම නිරීක්ෂණය කරමි. ඒ අනුව මෙම නිලධාරියා පළමු ශ්‍රේණියට උසස් කිරීම පිණිස ඔහු ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම යෝග්‍ය බව නිර්දේශ කරමි.
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ඇමතූ, මුදල් ආමාත්‍යාංශය, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2022.11.08 දිනැති ලිපියේ 03 ඡේදය,

***එහෙයින් විධායක නිලධාරී I ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම නිලධාරියා ලබා ඇති පශ්චාත් උපාධිය යෝග්‍ය බව නිර්දේශ කරමි.***

සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී මෙම පශ්චාත් උපාධිය සංවර්ධන විෂය ධාරව යටතේ පිළිගත නොහැකි බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා සිටීම පිළිබඳව මෙම අධිකාරයට එකඟ වීම අපහසුය.

ඉහත සියළු කරුණු පිළිබඳව සළකා බලා, අභියාචක වෙත නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවලංගු කිරීමට නියෝග කරමු. එසේම අභියාචක දැනට විශ්‍රාම ලබා ඇති බැවින්, අදාළ විශ්‍රාම වැටුප් සකස්කර ගැනීමට හැකිවන පරිදි විශ්‍රාම ගැන්වීමේ දිනට පෙර පළමු ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බවටද නියෝග කරමු.

ඒ අනුව අභියාචකගේ ඉල්ලීමට ඉඩදී ඇත.

ඒ බැව් අභියාචක, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-